WWW.OLEVELAPI.COM

# 66 - පාලි

## ලකුණුදීමේ පටිපාටිය

01. **ප්‍රශ්නය**

නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි. **(ලකුණු 20)**

02. **ප්‍රශ්නය**

(අ) නිවැරදි ලෙස එක් පාලි පාඨයක් සිංහලට නැගීම සඳහා ලකුණු 04 බැගින් ලකුණු 12 කි.

(ආ) එක් නිවැරදි වාක්‍යයකට ලකුණු 04 බැගින් ලකුණු 08 කි.

**(ලකුණු 20)**

03. **ප්‍රශ්නය**

i. නිවැරදි පිළිතුරට ලකුණු 04 කි.

ii. නිවැරදි ව ගාථාව සම්පූර්ණ කිරීමට ලකුණු 04 කි.

iii. නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 04 කි.

iv. 1 +1+2 වශයෙන් කොටස් තුනට ලකුණු 04 කි.

v. නිවැරදි හිස්තැන් පිරවීමකට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 04 කි.

**(ලකුණු 4 x 5 = 20)**

04. **ප්‍රශ්නය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ඉ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ඊ) එක් නිවැරදි පිළිතුරකට $^1/_2$ බැගින් ලකුණු 05 කි.

**(ලකුණු 5 x 4 = 20)**

05. **ප්‍රශ්නය**

WWW.OLEVELAPI.COM

නිවැරදි එක් කොටසකට පිළිවෙලින් ලකුණු 2+4+4+4+6 බැගින් සම්පූර්ණ ලකුණු 20 කි.

**(ලකුණු 20)**

06. **ප්‍රශ්නය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 07 කි.

(ඉ) නිවැරදි වාක්‍ය සහිත එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 08 කි.

**(ලකුණු 20)**

07. **ප්‍රශ්නය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 06 කි.

(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 06 කි.

(ඉ) ප්‍රමාණවත් පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 08 කි. **(ලකුණු 20)**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

WWW.OLEVELAPI.COM

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**66 STE**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

**පාලි**
பாளி
**Pali**

**12.12.2019 / 0830 – 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.
Use additional reading time to go through the question paper, select the questions and decide on the questions that you give priority in answering.

| Q. NO | Marks |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| Total | |

| | |
|---|---|
| Entered by | |
| Checked by | |
| TOTAL MARKS | |

විභාග අංකය / சுட்டெண் / Index Number ....................................

**වැදගත්** : මෙම ප්‍රශ්න පත්‍රයට **එක් භාෂාවකින් පමණක්** පිළිතුරු සැපයිය යුතුයි.
**முக்கியம்** : இவ்வினாத்தாளுக்குரிய விடைகளை **ஒரு மொழியில் மட்டுமே எழுதுதல்** வேண்டும்.
**Important** : *This question paper should be answered entirely in* ***one language only.***

- ✳ **1** ප්‍රශ්නය හා **2** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට මෙම පත්‍රයේම** පිළිතුරු සපයන්න.
- ✳ **1** ஆம் **2** ஆம் வினாக்கள் உள்ளிட்ட **ஐந்து** வினாக்களுக்கு **இத்தாளிலேயே** விடை எழுதுக.
- ✳ *Answer* ***five*** *questions including questions* ***1*** *and* ***2*** ***on this paper itself.***

**1.** පහත දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.
பின்வரும் வினாக்களுக்கான சரியான விடையின் கீழே கோடிடுக.
Underline the correct answer for the following questions.

(i) අකාරාදි පිළිවෙළ අනුව මුලටම යෙදෙන වචනය තෝරන්න.
அகராதி வரிசைப்படி முதலில் வரும் சொல்லைத் தெரிவு செய்க.
Select the word that comes first according to the alphabetical order.

(1) උපොසථං (2) උපෙහි
(3) උපායො (4) උපාසකං
(1) uposathaṃ (2) upehi
(3) upāyo (4) upāsakaṃ

(ii) ස්ත්‍රීලිංගික නාම පදයක් **නො වන්නේ** මේවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் பெண்பால் பெயர்ச்சொல் **அல்லாதது** எது?
Which of the following is a **non**-feminine noun?

(1) පූජා (2) ලඞ්කා (3) වරාහා (4) සාලා
(1) pūjā (2) Laṅkā (3) varāhā (4) sālā

(iii) **පච්චාරොහිත්වා** යන්නෙහි අර්ථය කුමක් ද?
**paccārohitvā** என்ற சொல்லின் கருத்து யாது?
Which is the meaning of the term **paccārohitvā**?

(1) තබා (2) දන්වා (3) නැග (4) බැස
(1) வைத்திருந்த (2) அறிவித்த (3) ஏறிய (4) இறங்கிய
(1) having kept (2) having informed (3) having ascended (4) having descended

(iv) නාමයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදෙන පද අයත් වන ව්‍යාකරණ ප්‍රවර්ගය වන්නේ
பெயர்ச்சொல்லுடன் பின்னொட்டு ஒன்றைச் சேர்ப்பதால் உருவாகும் சொல்லின் இலக்கண வகை
The grammatical category into which words made by adding a suffix to a noun belong is

(1) ආඛ්‍යාත ය. (2) කිතක ය. (3) තද්ධිත ය. (4) සමාස ය.
(1) ākhyāta. (2) kitaka. (3) taddhita. (4) samāsa.

(v) **අජ්ජතනී පරස්සපද** උත්තමපුරිස ඒකවචන හා බහුවචන ප්‍රත්‍යය යුගලය ඇතුළත් වරණය තෝරන්න.
**Ajjatanī parassapada** என்ற தன்மைப் பெயரின் ஒருமை மற்றும் பன்மை பின்னொட்டுகள் கொண்ட விடையைத் தெரிவு செய்க.
Select the option that contains the pair of singular and plural suffixes of **Ajjatanī parassapada** first person.

(1) ඉං, ම්හා (2) ඊ, උං
(3) එ, ආමසෙ (4) එ, ම්හෙ
(1) iṃ, mhā (2) ī, uṃ
(3) e, āmase (4) e, mhe

(vi) **දීඝිති කොසලරාජා දූරතොව** .................. **කුමාරං අද්දස** මෙහි හිස්තැනට සුදුසු පදය කුමක් ද?
**Dīghīti Kosalarājā dūratova** .................. **kumāraṃ addasa** கீறிட்ட இடத்திற்குப் பொருத்தமான சொல் எது?
Which is the appropriate word to fill in the blank of **Dīghīti Kosalarājā dūratova** .................. **kumāraṃ addasa**?

(1) ආගච්ඡං (2) ආගච්ඡන්තං (3) ආගච්ඡන්තො (4) ආගච්ඡන්තෙ
(1) āgacchaṃ (2) āgacchantaṃ (3) āgacchanto (4) āgacchante

(vii) ලේඛන දෝෂවලින් යුක්ත ගාථා පාඨය තෝරන්න.
வாக்கியப் பிழையுள்ள செய்யுள் வரியைத் தெரிவு செய்க.
Select the verse line with errors of writing.

(1) අච්චයං ඛම මෙ භන්තෙ (2) සොත්ති තෙ හොතු සබ්බදා
(3) කායො ජිගුච්ඡො සකලො දුගන්ධො (4) හන්තු තෙසං උපද්දවෙ
(1) accayaṃ khama me bhante (2) sotti te hotu sabbadā
(3) kāyo jigucchо sakalo dugandho (4) hantu tesaṃ upaddave

(viii) අසමානාර්ථවත් පද සහිත වරණය තෝරන්න.
வேறுபட்ட கருத்துத்தரும் சொற்கள் கொண்ட விடையைத் தெரிவு செய்க.
Select the option with words different in meaning.

(1) ඉත්ථි, නාරි, භරියා, වනිතා (2) අක්ඛි, අච්ඡි, චක්ඛු, නයනං
(3) අම්බු, උදකං, ජලං, වාරි (4) භූපාලො, භූමිපති, මහීපාලො, රාජා
(1) itthi, nāri, bhariyā, vanitā (2) akkhi, acchi, cakkhu, nayanaṃ
(3) ambu, udakaṃ, jalaṃ, vāri (4) bhūpālo, bhūmipati, mahīpālo, rājā

(ix) පරස්වරලෝප සන්ධියට පමණක් නිදසුන් සහිත වරණය කුමක් ද?
பரஸ்வரலோப சந்திக்கு மட்டும் உதாரணம் தரப்பட்டுள்ள விடை எது?
Which is the option that contains examples only of combination made by deletion of the second vowel (parassaralopa)?

(1) යානීධ, තථූපමං, බහූපකාරං, යථරිව
(2) සප්පුරිසො, දුබ්බලො, අතික්කම්ම, අප්පමාදො
(3) නයිමස්ස, ඡළභිඤ්ඤා, අත්තදත්ථං, ඉතොනායති
(4) වන්දෙහං, සොහං, චක්කංව, ඉතිපි
(1) yānīdha, tathūpamaṃ, bahūpakāraṃ, yathariva
(2) sappuriso, dubbalo, atikkamma, appamādo
(3) nayimassa, chaḷabhiññā, attadatthaṃ, itonāyati
(4) vandehaṃ, sohaṃ, cakkaṃva, itipi

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(x) කර්මකාරක වාක්‍යයේ,
செயப்பாட்டு வினை வாக்கியங்கள் அமைக்கப்படுவது
Passive voice sentences are formed with

(1) කර්තෘ පඨමා විභක්තියෙන් හා කර්මය දුතියා විභක්තියෙන් යෙදේ.
(2) කර්තෘ තතියා විභක්තියෙන් හා කර්මය පඨමා විභක්තියෙන් යෙදේ.
(3) කර්තෘ පඨමා විභක්තියෙන් හා කර්මය තතියා විභක්තියෙන් යෙදේ.
(4) කර්තෘ තතියා විභක්තියෙන් හා කර්මය දුතියා විභක්තියෙන් යෙදේ.

(1) subject in Nominative case and object in Accusative case.
(2) subject in Instrumental (of Agent) case and object in Nominative case.
(3) subject in Nominative case and object in Instrumental (of Agent) case.
(4) subject in Instrumental (of Agent) case and object in Accusative case.

(1) எழுவாய் பதமா வேற்றுமையிலும் செயப்படுபொருள் துதியா வேற்றுமையிலும்.
(2) எழுவாய் ததியா வேற்றுமையிலும் செயப்படுபொருள் பதமா வேற்றுமையிலும்.
(3) எழுவாய் பதமா வேற்றுமையிலும் செயப்படுபொருள் ததியா வேற்றுமையிலும்.
(4) எழுவாய் ததியா வேற்றுமையிலும் செயப்படுபொருள் துதியா வேற்றுமையிலும்.

($2 \times 10 = 20$ *marks*)

**ලකුණු දීමේ පිළිවෙල එක් නිවැරදි පිළිතුකරට ලකුණු 02 බැගින් ලකුණු 20 ක් හිමි වේ.**

**2.** (අ) පහත දැක්වෙන පාලි පාඨ **සිංහලට** නගන්න.
(அ) பின்வரும் பாளி பந்திகளைத் **தமிழில்** மொழிபெயர்க்க.
(a) Translate the following Pali passages into **English**.

(i) මහාවාසවිහාරෙ අරියවංසධම්මදෙසනා කථනකාලෙ කණ්ඩරජ්ජවාසී එකො මහාථෙරො ධම්මං සොස්සාමීති වත්වා ගන්ත්වා අත්තනො නිසීදනඔකාසං අලභිත්වා පරිසපරියන්තෙ එකස්මිං තිණගුම්බෙ අට්ඨාසි.
Mahāvāsavihāre Ariyavaṃsadhammadesanā kathanakāle Kaṇḍarajjavāsī eko mahāthero dhammaṃ sossāmīti vatvā gantvā attano nisīdanaokāsaṃ alabhitvā parisapariyante ekasmiṃ tiṇagumbe aṭṭhāsi.

**ආදර්ශ පිළිතුර** :- මාහාවාස විහාරයෙහි අරියවංශ ධර්ම දේශනාව දේශනා කරන කල්හි කණ්ඩරජ්ජවාසි එක් මහතෙර නමක් ධර්මය අසන්නෙමියි කියා ගොස් තමාට හිඳගැනීමට තැනක් නොලැබ පිරිස් කෙළවර එක තෘණ ලැහැබක සිටියේ ය.

WWW.OLEVELAPI.COM

(ii) භන්තෙ සුමෙධ, න ත්වං ජානාසි? දීපඞ්කරදසබලො සම්මාසම්බොධිං පත්වා පවත්තවරධම්මචක්කො චාරිකං චරමානො අම්හාකං නගරං පත්වා සුදස්සනමහාවිහාරෙ පටිවසති. මයං තං භගවන්තං නිමන්තයිම්හ.
Bhante Sumedha, na tvaṃ jānāsi? Dīpaṅkaradasabalo sammāsambodhiṃ patvā pavattavaradhammacakko cārikaṃ caramāno amhākaṃ nagaraṃ patvā Sudassanamahāvihāre paṭivasati. Mayaṃ taṃ Bhagavantaṃ nimantayimha.

**ආදර්ශ පිළිතුරු** :- පින්වත් සුමේධය, ඔබ නො දනිහි ද? දීපංකර බුදුන් වහන්සේ සම්‍යක් සම්බෝධියට පැමිණ පැවැත්වූ උතුම් ධර්මචක්‍රය ඇති සේක් චාරිකාවේ හැසිරෙන සේක් අපගේ නගරයට පැමිණ සුදර්ශන මහා විහාරයෙහි වැඩ වසති, අපි ඒ භාග්‍යවතුන් වහන්සේට ඇරයුම් කළෙමු.

(iii) එකමන්තං ඨිතො ඛො සාරිපුත්තො පරිබ්බාජකො ආයස්මන්තං අස්සජිං එතදවොච. විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්ද්‍රියානි. පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කංසි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා?

Ekamantaṃ ṭhito kho Sāriputto paribbājako āyasmantaṃ Assajiṃ etadavoca. Vippasannāni kho te āvuso indriyāni. Parisuddho chavivaṇṇo pariyodāto. Kaṃsi tvaṃ āvuso uddissa pabbajito? Ko vā te satthā?

**ආදර්ශ පිළිතුර** :- එකස්පසක සිටියාවූ ශාරිපුත්‍ර පරිබ්‍රාජක තෙමේ අයුෂ්මත් අස්සජි තෙරුන්ට මෙසේ කීය. ඇවැත්නි ඔබගේ ඉන්ද්‍රියයෝ වූ කලී අතිශයින් ප්‍රසන්නයහ. ඡවි වර්ණය පිරිසිදු ය. නිර්මල ය, ඇවැත්නි ඔබ කවරෙක් උදෙසා පැවිදි වුයේහි ද? ඔබගේ ශාස්තෘවරයා කවරෙක් ද?

(ආ) පහත දැක්වෙන වාක්‍ය **පාලියට** නගන්න.
(ஆ) பின்வரும் வாக்கியங்களைப் **பாளியில்** மொழிபெயர்க்க.
(b) Translate the following sentences into **Pali**.

(i) ඉක්බිති රජතෙමේ පිරිස සමඟ ගඟෙහි නැවකින් ගියේ ය.
பின்னர் அரசர் பரிவாரங்களுடன் கப்பலில் நதியில் பயணம் செய்தார்.
Thereafter, the king voyaged the river with retinue by a ship.

අථ රාජා පරිසාය සද්ධිං ගඞ්ගායං / ගඞ්ගාය නාවාය අගමාසි.

(ii) දෙවිවරු අපගේ පුතුන් හා මුනුබුරන් රකිත්වා.
தேவர்கள் எங்கள் புத்திரர்களையும் பேரன்மார்களையும் காப்பாற்றுவாராக.
May the deities protect our sons and grandsons.

දෙවා අම්හාකං පුත්තෙ ච නත්තාරෙ ච රක්ඛන්තු.

**ලකුණු දීමේ පිළිවෙල :-**

**(අ) කොටසට ලකුණු 04 බැගින් හිමි වේ. දුෂ්කර පද මගහරිමින් කර ඇති මනඃකල්පිත පරිවර්තන වලට සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.**

**(ආ) කොටසේ එක් වාක්‍යයකට ලකුණු 04 බැගින් හිමි වේ. එක් දෝෂයකට ලකුණු 01 බැගින් අඩු කරන්න.**

3. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
பின்வரும் வினாக்களுக்கு விடையளிக்குக.
Answer the following questions.

(i) "අප්පමාදෙන මඝවා..." යනාදි ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ලියා දක්වන්න.
"Appamādena Maghavā..." - என்ற செய்யுளை எழுத்துப் பிழையின்றி எழுதுக.
Write the verse "Appamādena Maghavā..." with correct spellings.

**අප්පමාදෙන මඝවා - දෙවානං සෙට්ඨතං ගතො**

**අප්පමාදං පසංසන්ති - පමාදො ගරහිතො සදා**

(ii) පහත ගාථාවෙහි සරල අර්ථය දක්වන්න.
பின்வரும் செய்யுளின் எளிமையான கருத்தை எழுதுக.
Write the simple meaning of the following verse.

නාගවල්ලිදලූපෙතං - චුණ්ණපූගසමායුතං,
තාම්බූලං පතිගණ්හාතු - සකප්පූරමිදං ජිනො.

Nāgavallidalūpetaṃ - cuṇṇapūgasamāyutaṃ,
tāmbūlaṃ patigaṇhātu - sakappūramidaṃ jino.

**ආදර්ශ පිළිතුර** :- නාවැල් දළු (බුලත්) වලින් යුතු, සුණු සහ පුවක් වලින් යුක්ත කපුරු සහිත මේ දැහැත් බුදුරජාණන් වහන්සේ පිළිගන්නා සේක්වා.

(iii) පහත ගාථාවෙන් කියැවෙන වසලයකුගේ ගති ලක්ෂණ **හතරක්** සිංහල අරුත් සහිතව පෙන්වා දෙන්න.
பின்வரும் செய்யுளில் கூறப்படும் தாழ்குலத்தவனின் **நான்கு** குணாதியங்களை தமிழ் மொழிக் கருத்துக்களுடன் எழுதுக.
Write **four** characteristics of an outcaste with reference to the following verse with their meanings in English.

කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති.

Kodhano upanāhī ca - pāpamakkhī ca yo naro,
vipannadiṭṭhi māyāvī - taṃ jaññā vasalo iti.

01. **කොධනො** - ක්‍රෝධ කිරීම
02. **උපනාහි** - බඳනා ලද වෛර ඇති බව
03. **පාපමක්ඛී** - පව්ටු ලාමක ගුණමකුකම
04. **විපන්නදිට්ඨි** - විපරීත දෘෂ්ටි ඇති බව
05. **මායාවී** - මායාකාරි බව

WWW.OLEVELAPI.COM

(iv) පහත ගාථාව ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
பின்வரும் செய்யுள் அடிகளைக் கொண்டு கேட்கப்பட்ட வினாக்களுக்கு சுருக்கமாக விடை தருக.
With reference to the following verse, answer the questions in brief.

ඉමිනා පුඤ්ඤකම්මෙන - මා මෙ බාලසමාගමො,
සතං සමාගමො හොතු - යාව නිබ්බාණපත්තියා.

Iminā puññakammena - mā me bālasamāgamo,
sataṃ samāgamo hotu - yāva nibbāṇapattiyā.

(1) මෙම ගාථාවේ ඇතුළත් නිපාත පද කෙතෙක් ද? 02 කි

இவ்வரிகளில் அடங்கியுள்ள நிபாத சொற்கள் எத்தனை? ..........

How many indeclinables (nipāta) are there in this verse? ..........

(2) **සතං** යන පදයේ විභක්තිය හා වචනය දක්වන්න. ෂට්ඨී - බහුවචන

**satam** என்ற சொல்லின் வேற்றுமையையும் சொல்லையும் எழுதுக. ..........

Write the case and number of the word **sataṃ**. ..........

(3) මෙම ගාථාවෙන් කරනු ලබන ප්‍රාර්ථනය කුමක් ද? මේ පින්කමෙන් නිවන් දකිනා තුරු මට බාලයන්ගේ ඇසුර නොවේවා, සත්පුරුෂයන්ගේ ඇසුර වේවා.

(v) පහත වගුවෙහි දක්වා ඇති පදවල විසන්ධිරූප හා අර්ථ දක්වන්න.
பின்வரும் அட்டவணையில் தரப்பட்டுள்ள சொற்களின் சொற்பிரிப்பையும் கருத்தையும் எழுதுக.
Write the disjoined forms and meanings of the words given in the table.

| පදය / Word / சொல் | විසන්ධිය / Disjoined form / பிரிக்கப்பட்ட வடிவம் | අර්ථය / Meaning / கருத்து |
|---|---|---|
| එකපුත්තමනුරක්ඛෙ / ekaputtamanurakkhe | එක පුත්තං + අනුරක්ඛෙ | එකම පුතු රකින්නේය |
| තිරියඤ්ච / tiriyañca | තිරියං + ච | සරසට ද |
| එවම්පි / evampi | එවං + අපි | මෙසේ ද |
| ඉධමාහු / idhamāhu | ඉධ + ආහු | මෙහි ලා කියති |

(4 × 5 = 20 *marks*)

**ලකුණු දීමේ පිළිවෙල :-**

**(i)** නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ලියා ඇති එක් ගාථා පාදයකට ලකුණු 01 බැගින් දෙන්න.

**(ii)** නිවැරදි පරිවර්තනයට ලකුණු 04 ක් හිමි වේ. අරුත් මගහැර ඇත්නම් එක ගාථා පාදයකට ලකුණු භාගය බැගින් අඩු කරන්න

**(iii)** සිංහල අරුත් සහිතව එක් නම් කිරීමකට ලකුණු එක බැගින් හිමිවේ.

**(iv)** 1 + 1+2 යන පිළිවෙලට බෙදා ගෙන ලකුණු පිරිනමන්න

**(v)** ලකුණු භාගය බැගින් ලකුණු 04 ක් හිමි වේ.

4. (අ) පහත දැක්වෙන නිපාත පදවල විරුද්ධාර්ථවත් පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.
(அ) பின்வரும் நிபாத சொற்களின் எதிர்க்கருத்துச் சொற்களை அடைப்புக்குறிக்குள் இருந்து தெரிவு செய்து கீறிட்ட இடங்களை நிரப்புக..
(a) Select the antonyms of the following indeclinables from the brackets and fill in the blanks.

(i) අන්තො ........බහි.................. (අතො, අද්ධා, බහි)
anto ............................ (ato, addhā, bahi)

(ii) උද්ධං ........අධො.................. (අධො, ධුවං, සද්ධිං)
uddhaṃ ............................ (adho, dhuvaṃ, saddhiṃ)

(iii) පච්ඡා ........පුරෙ.................. (උච්චා, පුරෙ, මිච්ඡා)
pacchā ............................ (uccā, pure, micchā)

(iv) පාතො ........සායං.................. (ඉතො, කුතො, සායං)
pāto ............................ (ito, kuto, sāyaṃ)

(v) සනිකං ........ඛිප්පං.................. (ඛිප්පං, පුනප්පුනං, සකිං)
sanikaṃ ............................ (khippaṃ, punappunaṃ, sakiṃ)

(ආ) පහත සඳහන් පදයන්හි සමාස ප්‍රභේද නම් කරන්න.
(ஆ) பின்வரும் சொற்களின் சமாஸப் பெயர் வகையினைக் குறிப்பிடுக.
(b) Name the categories of Compound nouns of the following words.

(i) ඛීණාසවො / khīṇāsavo ........බහුබ්බීහි........
(ii) දසසීලං / dasasīlaṃ ........දිගු........
(iii) පත්තචීවරං / pattacīvaraṃ ........ද්වන්ද........
(iv) යාවජීවං / yāvajīvaṃ ........අබ්‍යයීභාව........
(v) සුමනාදෙවී / Sumanādevī ........කම්මධාර........

(ඉ) වරහන් තුළ දී ඇති පද යොදා ගනිමින් පහත දැක්වෙන අර්ථ ප්‍රකාශ වන තද්ධිත පද පාලියෙන් ලියන්න.
(இ) அடைப்புக் குறிக்குள் தரப்பட்டுள்ள சொற்களைப் பயன்படுத்தி கீழே தரப்பட்டுள்ள கருத்தினை வெளிப்படுத்தும் தத்தித சொற்களைப் பாளியில் எழுதுக.
(c) Write in Pali the Secondary Derivatives using the words given in brackets to denote following meanings.

(i) අටවෙනියා (අට්ඨ) / the eighth one (aṭṭha) / எட்டாம்நபர் ........අට්ඨමො........
(ii) දසවරක් (දස) / ten times (dasa) / பத்துத் தடவை ........දසක්ඛත්තුං........
(iii) මිනිසත්කම (මනුස්ස) / humanity (manussa) /மனிதத்துவம் ........මනුස්සත්තං........
(iv) රනින් කළ (සුවණ්ණ) / made of gold (suvaṇṇa) / தங்கத்தால் செய்த ........සුවණ්ණමයං/සොවණ්ණමයං........
(v) ලංකාවෙහි උපන් තැනැත්තා (ලඞ්කා) / born in Lanka (Laṅkā) / இலங்கையில் பிறந்தவன் ........ලඞ්කිකො........

(ඊ) පහත වගුවේ ඇතුළත් ධාතුවලින් සෑදෙන වර්තමාන හා අතීත කිතක පද එක බැගින් ලියා දක්වන්න.

(ஈ) பின்வரும் அட்டவணையில் உள்ள வினையடிச் சொற்களைக் கொண்டு நிகழ்கால இறந்தகால கிதகய சொல் ஒவ்வொன்றை எழுதுக.

(d) Write present and past participles from each of the verbal roots given in the following table.

| ධාතුව<br>Root<br>அடி | වර්තමාන කිතකය<br>Present participle<br>நிகழ்கால கித்தக | අතීත කිතකය<br>Past participle<br>இறந்தகால கித்தக |
|---|---|---|
| පූජ / pūja | **පූජෙන්ත / පූජමාන** | **පූජිත** |
| චර / cara | **චරන්ත / චරමාන** | **චරිත** |
| රුද / ruda | **රුදන්ත / රුදමාන** | **රුදිත / රුණ්ණ** |
| වද / vada | **වදන්ත / වදමාන** | **වදිත / වුත්ත** |
| හස / hasa | **හසන්ත / හසමාන** | **හසිත / හට්ඨ** |

(5 × 4 = 20 *marks*)

**ලකුණු දීමේ පිළිවෙල :-**

**(අ) (ආ) (ඉ) යන කොටස් වල නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් හිමි වේ.**

**(ඊ) කොටසේ එක් නිවැරදි පිළිතුරකට ලකුණු භාගය බැගින් හිමි වේ.**

5. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
பின்வரும் பந்தியை வாசித்து வினவப்பட்டுள்ள வினாக்களுக்கு விடையளிக்குக.
Read the following passage and answer the questions given below.

පච්ඡා රඤ්ඤො අනුරාධපුරෙ ඡත්තං උස්සාපිතකාලෙ ගොඨයිම්බරස්ස මහන්තං යසසම්පත්තිං දත්වා මහාවීථියා ගෙහං කාරෙසි. සො පන අමච්චො අනුරාධපුරෙ වසන්තො එකයොජනමත්තකෙ ඨිතං දූරතිස්සවාපිං ගන්ත්වා සරීරපරිකම්මං කත්වා නිච්චං ආගච්ඡති කිර. අථෙකදිවසං තිස්සවාපිමරියාදෙ ඉස්සරසමණවිහාරං අගමාසි. තස්මිං විහාරද්වාරෙ මහන්තො එකො වෙළුගුම්බො විහාරමග්ගං ආවරිත්වා අට්ඨාසි. තස්මිං විහාරෙ එකො මහාථෙරො බහූ කුද්දාලපිටකඤ්ච ගාහාපෙත්වා තං වෙළුගුම්බං හරාපෙතුං අගමාසි. අමච්චො ථෙරං දිස්වා 'කිං කරොථ භන්තෙ'ති ආහ. ථෙරො 'ඉමං වෙළුගුම්බං හරාපෙමා'ති ආහ. අමච්චො ථෙරස්ස කථං සුත්වා මහාවම්මයොත්තං ආහරාපෙත්වා තස්මිං වෙළුගුම්බපාදෙ බන්ධිත්වා වාමහත්ථෙන සමූලං උද්ධරිත්වා මග්ගෙන ඔක්කමිත්වා බහි පාතෙත්වා සයං නගරං අගමාසි. තං පන වෙළුං පරිගය්හමානං සට්ඨිසකටමත්තං අහොසි.

(i) මෙහි සඳහන් යෝධයා දිනපතා කළ ක්‍රියාවක් ගෙනහැර දක්වන්න.
இங்கு குறிப்பிடப்பட்டுள்ள இராட்சதனின் நாளாந்த செயற்பாடு ஒன்றைக் குறிப்பிடுக.
Point out a daily activity of the giant mentioned here.

**ආදර්ශ පිළිතුර :-** දූරතිස්ස වැවට ගොස් සිරුර පිරිසිදු කිරීම

(ii) ඡේදයේ සඳහන් පුද්ගල නාම හා ස්ථාන නාම **දෙක** බැගින් ලියා දක්වන්න.
இப்பந்தியில் குறிப்பிடப்பட்டுள்ள நபர் **இருவரினதும்** இடங்கள் **இரண்டினதும்** பெயரைக் குறிப்பிடுக.
Write **two** individual names and place names given in the passage.

**ආදර්ශ පිළිතුර** :-

**පුද්ගල** - ගොඨයිම්බරො , අමච්චො, මහාථෙරො

**ස්ථාන** - අනුරාධපුරං, දූරතිස්සවාපිං, ඉස්සරසමණවිහාරං

(iii) **සරීරපරිකම්මං, කුද්දාලඵරසුං, වෙළුගුම්බං, මහාචම්මයොත්තං** යන පදවල අරුත් දක්වන්න.
**sarīraparikammaṃ, kuddālapharasuṃ, veḷugumbaṃ, mahācammayottaṃ** எனும் சொற்களின் கருத்தை எழுதுக.
Write the meanings of the words **sarīraparikammaṃ, kuddālapharasuṃ, veḷugumbaṃ** and **mahācammayottaṃ**.

**ආදර්ශ පිළිතුර** :-

**සරීරපරිකම්මං** - සිරුර පිරිසිදු කිරීම

**කුද්දාලඵරසුං** - උදලු - පොරෝ

**වෙළුගුම්බං** - උණ පඳුරක්

**මහාචම්මයොත්තං** - මහත් සම්යොතක් (රැහැනක්)

(iv) මෙම ඡේදයේ දැක්වෙන පූර්වක්‍රියා පද **අටක්** ඒවායේ තේරුම සහිතව ලියා දක්වන්න.
இப்பந்தியில் குறிப்பிடப்பட்டுள்ள **எட்டு** வினையெச்ச சொற்களை அவற்றின் கருத்துக்களுடன் எழுதுக.
Extract **eight** Gerunds from this passage and write with their meaning.

**ආදර්ශ පිළිතුර** :-

| | |
|---|---|
| දත්වා - දී | ගාහාපෙත්වා - ගෙන්වාගෙන |
| ගන්ත්වා - ගොස් | දිස්වා - දැක |
| කත්වා - කොට | සුත්වා - අසා |
| ආචරිත්වා - අවුරා | ආහරාපෙත්වා - ගෙන්වවා |
| බන්ධිත්වා - බැඳ | උද්ධරිත්වා - උදුරා |
| ඔක්කමිත්වා - ඉවත්ව | පාතෙත්වා - හෙළා |

WWW.OLEVELAPI.COM

(v) මෙම ඡේදයේ දැක්වෙන සිදුවීම කෙටියෙන් ලියා දක්වන්න.
இப்பந்தியில் குறிப்பிடப்பட்டுள்ள சம்பவத்தைச் சுருக்கமாக எழுதுக.
Write in brief the incident mentioned in this passage.

**ආදර්ශ පිළිතුර :-** රජු රජවී ගෝඨයිම්බරට මහත් සම්පත් දී මහා විදීයේ ගෙයක් කරවීය. ඔහු හැමදා දූරතිස්ස වැවට ගොස් සිරුර පිරිසිදු කොට එයි. දිනක් ඔහු ඉසුරුමුණි විහාරයට ගියේය. ඒ වෙහෙරෙහි වැසි තෙරනමක් මග අවුරා සිටි උණ පඳුරක් ඉවත් කිරීමට උදලු පොරෝ ගෙන සිටියේ ය. කරුණු අසා දැනගත් ඇමතියා මහත් සම්යොතක් ගෙන්වා ගෙන එම පදුරෙහි බැඳ වමතින් එය උගුලුවා විසි කොට ගියේය.

**ලකුණු දීමේ පිළිවෙල :-**

**(i) කොටසේ නිවැරදි පිළිතුරට ලකුණු 02 කි.**

**(ii) කොටසේ නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 04 ක් හිමිවේ.**

**(iii) කොටසේ නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් 04 කි.**

**(iv) කොටසේ පූර්ව ක්‍රියාපද දැක්වීමට ලකුණු $\frac{1}{4}$ බැගින් ලකුණු 02 කි. නිවැරදි අර්ථය දැක්වීමට ලකුණු $\frac{1}{4}$ බැගින් ලකුණු 02 කි.**

**(v) පාඨයෙන් දැක්වෙන අදහස විධිමත් ලෙස සාරාංශගත කොට දක්වා ඇත්නම් ලකුණු 06 පිරිනමන්න.**

6. (අ) සුදුසු විශේෂණ පදය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.
(அ) பொருத்தமான பெயரடைகளை அடைப்புக் குறிக்குள் இருந்து தெரிவு செய்து கீறிட்ட இடங்களை நிரப்புக.
(a) Fill in the blanks selecting the appropriate Adjective from the brackets.

(i) ....**අයං**.... දාරකො (අයං / ඉමෙ / එතං)
.................... dārako (ayaṃ / ime / etaṃ)

(ii) ....**චතස්සො**.... ඉත්ථියො (චතුරො / චතස්සො / චත්තාරි)
.................... itthiyo (caturo / catasso / cattāri)

(iii) ....**ධනවතො**.... වාණිජස්ස (ධනවා / ධනවන්තං / ධනවතො)
.................... vāṇijassa (dhanavā / dhanavantam / dhanavato)

(iv) ....**සුඛං**.... සයති. (සුඛො / සුඛං / සුඛම්හා)
.................... sayati. (sukho / sukhaṃ / sukhamhā)

(v) ....**සබ්බෙහි**.... මනුස්සෙහි (සබ්බෙහි / සබ්බෙ / සබ්බාහි)
.................... manussehi (sabbehi / sabbe / sabbāhi)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ආ) වරහන් තුළ දී ඇති පද සුදුසු තැන්හි යොදා හිස්තැන් පුරවන්න.
(ஆ) அடைப்புக் குறிக்குள் தரப்பட்டுள்ள சொற்களைப் பொருத்தமான இடங்களில் இட்டு கீறிட்ட இடங்களை நிரப்புக.
(b) Fill in the blanks of the following passage inserting the given words in brackets in the appropriate places.

(කක්ඛලා, කථෙත්වා, ජානිස්සාමාති, දිට්ඨකාලතො, බ්‍රාහ්මණපුරොහිතා, සුඛං, හත්ථෙ)

**(kakkhalā, kathetvā, jānissāmāti, diṭṭhakālato, brāhmaṇapurohitā, sukhaṃ, hatthe)**

අථ නං පභාතාය රත්තියා ....**බ්‍රාහ්මණපුරොහිතා**.... උපසංකමිත්වා සුඛමසයිත්ථ මහාරාජාති පුච්ඡිංසු. කුතො මෙ ආචරියා ....**සුඛං**....? අජ්ජාහං පච්චූසසමයෙ සොළසමහාසුපිනෙ පස්සිං. සොම්හි තෙසං ....**දිට්ඨකාලතො**.... පට්ඨාය භයප්පත්තො, වදෙථ ආචරියාති. සුත්වා ....**ජානිස්සාමාති**.... වුත්තෙ බ්‍රාහ්මණානං දිට්ඨසුපිනෙ ....**කථෙත්වා**.... කින්නු ඛො මෙ ඉමෙසං දිට්ඨකාරණා භවිස්සතීති පුච්ඡි. බ්‍රාහ්මණා ....**හත්ථෙ**.... විධුනිංසු. කස්මා හත්ථෙ විධුනථාති ච වුත්තෙ ....**කක්ඛලා**.... මහාරාජ සුපිනානි.

Atha naṃ pabhātāya rattiyā .............................. upasaṃkamitvā sukhamasayittha mahārājāti pucchiṃsu. Kuto me ācariyā ......................................? Ajjāhaṃ paccūsasamaye soḷasamahāsupine passiṃ. Somhi tesaṃ .............................. paṭṭhāya bhayappatto, vadetha ācariyāti. Sutvā .............................. vutte brāhmaṇānaṃ diṭṭhasupine .............................. kinnu kho me imesaṃ diṭṭhakāraṇā bhavissatīti pucchi. Brāhmaṇā .............................. vidhuniṃsu. Kasmā hatthe vidhunathāti ca vutte .............................. mahārāja supināni.

(ඉ) පහත දැක්වෙන මාතෘකා අනුව කෙටි පාලි වාක්‍ය **හතර** බැගින් ලියන්න.
(இ) பின்வரும் தலைப்புகள் ஒவ்வொன்றிற்கும் சுருக்கமான **நான்கு** பாளி வாக்கியங்கள் எழுதுக.
(c) Write **four** short Pali sentences for each of the following topics.

(i) සිද්ධත්ථකුමාරො / Siddhatthakumāro

(ii) මය්හං මාතා / Mayhaṃ mātā

**ලකුණු දීමේ පිළිවෙල :-**

**(අ)** **නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි**

**(ආ)** **කොටසේ නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 07 කි**

**(ඉ)** **මාතෘකා දෙකටම පිළිතුරු සපයා තිබිය යුතුය. එක කොටසකට ලකුණු 04 කි. එක් නිවැරදි වාක්‍යයකට එක ලකුණු බැගින් පිරිනමන්න. ව්‍යාකරණ දෝෂ සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න**

7. (අ) පහත වගුවේ දී ඇති ශබ්ද මූලයන්හි පඨමා, තතියා හා සත්තමී විභක්ති ඒකවචන රූප ලියා දක්වන්න.
(அ) அட்டவணையில் தரப்பட்டுள்ள அடிச் சொற்களின் பிரதமா, திருதியா, சப்தமீ என்பவற்றின் வேற்றுமையை ஒருமை வடிவில் எழுதுக.
(a) Write Nominative, Instrumental (of Agent) and Locative singular forms of the Nominal Bases given in the following table.

| ශබ්ද මූලය<br>Nominal Base<br>பெயர் அடிச்சொல் | පඨමා<br>Nominative<br>பிரதமா | තතියා<br>Instrumental<br>(of Agent)<br>திருதியா | සත්තමී<br>Locative<br>சப்தமீ |
|---|---|---|---|
| බුද්ධ / Buddha | **බුද්ධො** | **බුද්ධෙන** | **බුද්ධෙ/බුද්ධම්හි /බුද්ධස්මිං** |
| රාජ / rāja | **රාජා** | **රඤ්ඤා** | **රඤ්ඤෙ/රාජිනි/මිහි/ස්මිං** |
| කඤ්ඤා / kaññā | **කඤ්ඤා** | **කඤ්ඤාය** | **කඤ්ඤායං** |
| චිත්ත / citta | **චිත්තං** | **චිත්තෙන** | **චිත්තෙ/චිත්තම්හි/ස්මිං** |

(ආ) අදාළ ආඛ්‍යාත විභක්තිවල පරස්සපද රූප ඇසුරෙන් පහත වගුවේ හිස්තැන් පුරවන්න.
(ஆ) பின்வரும் அட்டவணையிலுள்ள வெற்றிடங்களை ஆக்யாத வேற்றுமைகளின் பரஸ்பத வடிவம் கொண்டு பூரணப்படுத்துக.
(b) Fill in the blanks of the following table with Transitive forms (Parassapada) of the relevant Verbal Moods (Cases).

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අජ්ජතනී<br>Ajjatanī | ධාවි<br>dhāvi | **ධාවිංසු** | ධාවො<br>dhāvo | **ධාවිත්ථ** | **ධාවිං** | ධාවිම්හා<br>dhāvimhā |
| භවිස්සන්ති<br>Bhavissanti | **භවිස්සති** | ධාවිස්සන්ති<br>dhāvissanti | **භවිස්සසි** | ධාවිස්සථ<br>dhāvissatha | **භවිස්සාමි** | ධාවිස්සාම<br>dhāvissāma |
| පඤ්චමී<br>Pañcamī | ධාවතු<br>dhāvatu | **ධාවන්තු** | ධාවසි<br>dhāvasi | **ධාවථ** | ධාවාමි<br>dhāvāmi | **ධාවාම** |
| සත්තමී<br>Sattamī | **ධාවෙය්‍ය** | ධාවෙය්‍යුං<br>dhāveyyuṃ | **ධාවෙය්‍යාසි** | ධාවෙය්‍යාථ<br>dhāveyyātha | **ධාවෙය්‍යාමි** | ධාවෙය්‍යාම<br>dhāveyyāma |

WWW.OLEVELAPI.COM

(ඉ) "ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී" යන පාඨයේ වැදගත්කම නිදසුන් කථාවක් හෝ සිදුවීමක් මගින් පෙන්වා දෙන්න.

ආදර්ශ පිළිතුර :- 'ධර්මය ඒකාන්තයෙන් ධර්මයෙහි හැසිරෙන්නන් රකියි' යනු මෙහි තේරුමයි. මෙය ලෝක ධර්මතාවකි. මෙය සනාථ වන අවස්ථා සුලබව දැකිය හැකි ය. නිර්දිෂ්ට ග්‍රන්ථයේ දාරුසාකටිකපුත්ත වස්තුව (10- 03 පාඩම) කණ්ඩරාජ තෙරුන් වහන්සේගේ කථාව (11 - 02 පාඩම) වැනි කථා වස්තුවක් හෝ කිසියම් වෙනත් සිදුවීමක් මගින් මෙය තහවුරු කල හැකි ය.

**ලකුණු දීමේ පිළිවෙල :-**

**(අ), (ආ) කොටස්වල එක් නිවැරදි පිළිතුරකට ලකුණු භාගය බැගින් හිමි වේ.**

**(ඉ) කොටසට නිදසුන් කථාවක් හෝ සිදුවීමක් මගින් අදාළ කරුණු පැහැදිලි කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න**